ගෝලීය ශ්‍රී ලාංකික සංසදය
GLOBAL SRI LANKAN FORUM

Executive Committee – UAE Chapter

MIDDLE EAST | EUROPE | AUSTRALIA | NORTH AMERICA

2021 පෙබරවාරි 19

**නලින්ද විජේරත්න මැතිතුමා**
**කොන්සල් ජනරල්තුමා**
**ඩුබායි හා උතුරු එමීරයේ ශ්‍රී ලංකාවේ කොන්සියුලේට් ජනරාල්**
**තැ. පෙ. 51528**
**ඩුබායි - එක්සත් අරාබි එමීරය**

**මානව හිමිකම් කවුන්සිලයේ 2021 පෙබරවාරි 22 දින සිට 2021 මාර්තු 19 දින දක්වා පැවැත්වෙන 46 වැනි සැසිය සඳහා ඉදිරිපත් කෙරෙන අංක A/HRC/46/20 දරණ 12/1/2021 දාතමින් නිකුත් කරණ ලද ශ්‍රී ලංකාවට අදාල මහකොමසාරිස්ගේ වාර්තාවට ආණ්ඩුවේ ප්‍රතිචාරය සඳහා යෝජනා පිළිබඳව**

මහත්මයාණෙනි,

2016 වසරේ සිට අප සංගමයේ මූලික අරමුණවූයේ ජිනීවා මානව හිමිකම් කොමිසම සහ පසුගිය යහපාලන රජය එකතුව උල්ලංඝණය කරන ලද ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදාවල සාමාජිකයන්ගේ හා දේශපාලන අධිකාරියේ මානව හිමිකම් රැකදීමට කටයුතු කිරීමයි.

විවිධ ජනමාධ්‍යය වල ප්‍රකාෂවන දේශ හිතෛෂී කණ්ඩායම් සහ දේශපාලකයින් ප්‍රකාෂ කරන කරුණු සැලකිල්ලට ගැනීමෙන් උක්ත 46/20 චෝදනා පිළිබඳව රජයේ ස්ථාවරය දල වශයෙන් ප්‍රකාෂ කර ඇත්තේ එම චෝදනා ප්‍රතික්ශේප කරන බවහා 30/1 හි සඳහන් නිර්දේශ හොඳින් ක්‍රියාත්මක කරන බව හා ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුව වගවීම සහ ප්‍රතිසන්ධානයට අදාළ සියළු පියවර ගන්නා බවට ප්‍රතිඥා ලබා දී ඇති බවයි.

ඒ අනුව පසුගිය රජය විසින් පාර්ලිමෙන්තු පනත් මගින්ම එකඟවූ පරිදි:

- අතුරුදහන් වූවන්ගේ කාර්යාලය පවත්වාගෙන යෑම;
- අතුරුදහන්වීම වැලැක්වේමේ ජාත්‍යන්තර ප්‍රඥප්ති පනතට අනුව කටයුතු කිරීම (මේ යටතේ ජාත්‍යන්තර අධිකරණයට යැමට විදේශ විනිසුරුන්හට අධිකරණයට බලපෑම් කිරීමට හැකියාව ඇත) ;
- වින්දිතයින් ආරක්ෂා කිරීමේ පනත පවත්වාගෙන යෑම;
- උදර්පන පනත් දෙක (පොදු රාජ්‍යය මණ්ඩලීය සහ සර්ව ලෝක පනත) පවත්වාගෙන යෑම; සහ
- ත්‍රස්ථවාදීන්ගේ පවුල් වලටද වන්දි ගෙවේමේ පනත පවත්වාගෙන යෑම ආදිය

හොඳින් ක්‍රියාත්මක කිරීමට වත්මන් රජයද ක්‍රියාකරණු ඇතැයි යන්න ගම්‍ය වේ. ඊට අමතරව තව සිදු කිරීමට ඇති කරුණු වන්නේ:

- සත්‍ය සෙවීමේ සහ වග වීමේ කොමිසම පිහිටුවීම;
- හයි බ්‍රිඩ් අධිකරණය පිහිටුවීම; සහ
- බලය බෙදන ආකාරයට කළයුතු ව්‍යවස්ථා සංශෝධනයයි.

අපගේ අදහස වන්නේ මෙයින් රණවිරුවන්ට සිදුවී ඇති අසාධාරණය, ඔවුන්ගේ මානව අයිතිවාසිකම් කඩවීම හා ඔවුන් වෙනුවෙන් ස්වභාවික යුක්තිය ඉල්ලා රජය කටයුතු කරණ ආකාරයක් ඉන් ගම්‍ය නොවන බවයි. එසේම මේ වන විට රට රට වලට ඒක පාර්ෂවීයව ක්‍රියා කළ හැකිලෙස ඉඩ සළසා දී ඇති ප්‍රතිඥා හා ප්‍රතිපාදනද ඉන් ඉවත් නොවන බවයි.

මෙවර රජයේ අරමුණවී ඇත්තේ ප්‍රති යෝජනා ඉදිරිපත් කිරීම බවට අදාල අංශවල ප්‍රකාෂ වලින් පැහැදිලිවේ. එසේ ප්‍රතියෝජනා ඉදිරිපත් කරණු ලබන්නේනම් පහත සඳහන් කරුණු එයට ඇතුලත් කළ යුතු බවට අප යෝජනා කරන්නෙමු. ඒවානම්:

- OISL වාර්තා ක්‍රියා පටි පාටියම සාවද්‍යය බව;
- රණවිරුවන්ට ස්වභාවික යුක්තිය නිශ්චය සඳහා අවස්ථාවක් ඉල්ලීම;
- OISL නිර්දේශ අනුව පසුගිය රජය මගින් සම්මත කරන ලද අන පනත් පසුගිය ජනවරම මගින් අහෝසි කර ඇති බව;
- ත්‍රස්ථවාදීන්හට වන්දි ලබාදීමට අවශ්‍යානම් පිටරටවල ඇති LTTE හා සම්බන්ධ අරමුදල් සියල්ලම අප රජයට ලබාදීම;
- ඉන්දියා සාගර කළාපය 1976 දී සම්මත කරණ ලද ආකාරයට සාම කළාපයක් ලෙස පවත්වා ගැනීම තහවුරු කිරීම;
- ශ්‍රී ලංකාව විසින් ගෙනයන ලද මානුෂික මෙහෙයුම ඇගයීම හා ඉන් පසුව සිදුකරණලද ත්‍රස්ථවාදීන් පුනරුත්ථාපනය ආදිය ඇගයීම;
- LTTE සංවිධානය විසින් වැඩිහිටියන් පැහැරගෙන යෑම විමර්ෂණය (OISL පිටු 128-131);
- LTTE සංවිධානය විසින් ත්‍රස්තවාදී කටයුතු වෙනුවෙන් ළමුන් බඳවා ගැනීම සහ භාවිතා කිරීම විමර්ෂණය (OISL පිටු 132-144); හා
- LTTE සංවිධානය විසින් සිවිල් වැසියන් මිනිස් පළිහක් ලෙස රඳවා ගැනීම විමර්ෂණය (OISL පිටු 177-184).

අපගේ මෙම යෝජනා රජයේ අවධානය සඳහා යොමු කරනමෙන් කරුණාවෙන් ඉල්ලා සිටින්නෙමු.

මේ පිළිබඳවවූ මහජන පෙත්සමේ පිටපතක් ඔබතුමාගේ දැනගැනීම පිණිස මේ සමග අමුණා ඇත.

මෙයට

ගෝලීය ශ්‍රී ලාංකික සංසදය - විධායක කමිටුව

යසස් ධර්මදාස
විධායක කමිටු ලේකම් හා විධායක කමිටුවට අනුබද්ධිත ශාඛාවේ සභාපති

සමන්ත වීරමන්ත්‍රී
විධායක කමිටුවට අනුබද්ධිත ශාඛාවේ ලේකම්

රන්ජන් සහබන්දු
විධායක කමිටුවට අනුබද්ධිත ශාඛාවේ භාණ්ඩාගාරික

පිටපත්:
ගෝලීය ශ්‍රී ලාංකික සංසදය - විධායක කමිටුව
ජනමාධ්‍යය